## 1. 1. 4.

## අච්චෙන්තිසුත්තං

4. සාවත්ථියං—[1]

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

අච්චෙන්ති කාලා තරයන්ති රත්තියො වයොගුණා අනුපුබ්බං ජහන්ති.
එතං භයං මරණෙ පෙක්ඛමානො පුඤ්ඤානි කයිරාථ සුඛාවහානීති.

[භගවා:]

අච්චෙන්ති කාලා තරයන්ති රත්තියො වයොගුණා
අනුපුබ්බං ජහන්ති,
එතං භයං මරණෙ පෙක්ඛමානො ලොකාමිසං පජ්ජෙ
සන්තිපෙක්ඛොති.

## 1. 1. 5.

## කතිඡින්ද[2]සුත්තං

5. සාවත්ථියං—

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි:[3]

කති ඡින්දෙ කති ජහෙ කති චුත්තරි භාවයෙ,
කති සඞ්ගාතිගො 'භික්ඛු ඔඝතිණ්ණො'ති වුච්චතීති.

[භගවා:]

පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ පඤ්ච චුත්තරි භාවයෙ,
පඤ්ච සඞ්ගාතිගො 'භික්ඛු ඔඝතිණ්ණො'ති වුච්චතීති.

## 1. 1. 6.

## ජාගරසුත්තං

6. සාවත්ථියං—

එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි:

කති ජාගරතං සුත්තා කති සුත්තෙසු ජාගරා,
කතීහි රජමාදෙති කතීහි පරිසුජ්ඣතීති.

[භගවා:]

පඤ්ච ජාගරතං සුත්තා පඤ්ච සුත්තෙසු ජාගරා,
පඤ්චහි රජමාදෙති පඤ්චහි පරිසුජ්ඣතීති.

---

1. ඉදං න දිස්සතෙ - සතා. 2. කතිඡින්දි - සතා. 3. භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි - මජසං.

## 1. 1. 4.
## අච්චෙන්ති සූත්‍රය

4. සැවැත්නුවර--

එකත්පසෙක සිටි ඒ දෙවි තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

(පෙරවරු ආදි) කාලයෝ ඉක්ම යෙති. රාත්‍රීහු පුද්ගලයා මරණය කරා පමුණුවති. වයෝරාශීහු අනුක්‍රමයෙන් පුරුෂයා හැර යත්. මේ (ත්‍රිවිධ) භය මරණයෙහි ලා දක්නේ සැප එළවන පින් කරන්නේ ය.

[භගවත්හු:]
කාලයෝ ඉක්ම යති. රාත්‍රීහු (පුරුෂයා) මරණය කරා පමුණුවති. වයෝරාශීහු අනුක්‍රමයෙන් පුරුෂයා හැර යත්. මේ බිය මරණයෙහි ලා දක්නේ, නිවන් පතනුයේ (භවත්‍රය සඞ්ඛ්‍යාත) ලෝකාමිෂය දුරු කරන්නේයි.

## 1. 1. 5.
## කතිඡින්ද සූත්‍රය

5. සැවැත්නුවර--

එකත්පසෙක සිටි ඒ දෙවි තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙකින් සැලකළේ ය:

කෙතෙක් සිඳින්නේ ද? කෙතෙක් දුරු කරන්නේ ද? මින්තෙහි කෙතෙක් වඩන්නේ ද? කෙතෙක් සඞ්ග (ඇලීම්) ඉක්මවූ මහණ තෙමේ 'ඔඝතිණ්ණ'ය යි කියනු ලැබේ ද?

[භගවත්හු:]
පසක් සිඳින්නේ ය. පසක් දුරු කරන්නේ ය. ඉන් මතුයෙහි පසක් වඩන්නේ ය. සඞ්ග පසක් ඉක්මවූ මහණ තෙමේ 'ඔඝතිණ්ණ' ය යි කියනු ලැබේ.

## 1. 1. 6.
## ජාගර සූත්‍රය

6. සැවැත්නුවර--

එකත්පසෙක සිටි ඒ දෙවි තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කී ය:

(කීදෙනකුන්) නිදි වරද්දී කීදෙනෙක් නිදි ගත්තාහු වෙත් ද? (කීදෙනකුන්) නිදද්දී කීදෙනෙක් නිදිවරන්නෝ වෙත් ද? කෙතෙකින් (කෙලෙස්) රජස් ගණී ද? කෙතෙකින් පිරිසිදු වේ ද?

[භගවත්හු:]
පස් දෙනකුන් නිදි වරද්දී පස්දෙනෙක් නිදිගත්තාහු වෙත්. පස්දෙනකුන් නිදද්දී පස්දෙනෙක් නිදි වරන්නෝ වෙත්. පසෙකින් කෙලෙස් රජස් ගණී. පසෙකින් පිරිසිදු වේ යී.